# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2288/11 - 2022 ජූලි මස 12 වැනි අඟහරුවාදා - 2022.07.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

ඉඩම් අමාත්‍යාංශයේ අංකය: LD/05/2006/PC/239.
යොමු අංකය: KMB/LAN/ACQU1/2/59.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවයේ විස්තර:*

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 320 ගතාර නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි අ.ග.පි. 182හි අතිරේක අංක 10, පත්‍ර අංක 10 පිඹුරෙහි පෙන්නුම් කරන පහත සඳහන් ඉඩම් කොටස්.

01. **කැබලි අංකය 97**
ඉඩමේ නම: ඉහලහිරිදෙනිය *හෙවත්* කදුරුගහදෙනිය; විස්තරය: මුඩු බිම; හිමිකම් කියන අය: හේවා කොඩිතුවක්කු මනමාල ආරච්චිගේ සෝමපාල; ප්‍රමාණය: හෙක්. 0.2725.

02. **කැබලි අංකය 98**
ඉඩමේ නම: -; විස්තරය: ඇළ; හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0388.

03. **කැබලි අංකය 99**
ඉඩමේ නම: ඉහලහිරිදෙනිය *හෙවත්* කදුරුගහදෙනිය; විස්තරය: මුඩු බිම, බස් නැවතුම්පොළක් ඉදිකර ඇත; හිමිකම් කියන අය: හේවා කොඩිතුවක්කු මනමාල ආරච්චිගේ සෝමපාල; ප්‍රමාණය: හෙක්. 0.0053.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 සැප්තැම්බර් මස 05 වැනි දින පෙ.ව. 10.30ට කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2022 අගෝස්තු මස 29 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම්/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

කුසලක නානායක්කාර,
ප්‍රාදේශීය ලේකම්,
කඹුරුපිටිය.

2022 ජූලි මස 06 වැනි දින,
කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 07 - 0059

1A - G 37064 - 16 (2022/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

ඉඩම් අමාත්‍යාංශයේ අංකය: 03/ජේ/79/ඊ/462.
යොමු අංකය: කඹු/ඉඅ/3281.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ දැන්වීම, අංක 2263/39 හා 2022.01.21 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 7 වැනි වගන්තිය යටතේ දැන්වීමෙහි ඉඩමට හිමිකම්/අයිතිවාසිකම් කියාපෑම සඳහා සම්මුඛ විය යුතු දිනය 2022 සැප්තැම්බර් මස 06 වැනි දින ලෙස හා වන්දි මුදල් හා ඒ මුදල ගණන් බැලූ හැටි පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුත්තේ 2022 අගෝස්තු මස 29 වැනි දිනට මත්තෙන් යනුවෙන් සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

කුසලක නානායක්කාර,
ප්‍රාදේශීය ලේකම්,
කඹුරුපිටිය.

2022 ජූලි මස 06 වැනි දින,
කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 07 - 0060

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.